# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
## බස්නාහිර පළාත
மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் அலுவலகம்
மேல் மாகாணம்
## OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
## WESTERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எமது இல<br>My No. | WP/PD/ES/2/9/An.Transfer/2021<br>WP/PD/ES/2/14/An.Transfer/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.07. |

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

කොළඹ/ගම්පහ/කළුතර.

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2021</u>

උක්ත කරුණ සම්බන්ධව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/PTR/20-3/FI/3-2021 දරණ 2020.06.30 දිනැති ලිපිය හා බැඳේ.

02. අංක 2055/13 හා 2018.01.24 දිනැති (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළ කර ඇති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධ විධිවිධාන වලටද ස්ථාන මාරු ප්‍රතිපත්තියටද ඔබේ අවධානය යොමු කරවන අතර, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි හා සංවර්ධන නිලධාරී වාර්ෂික ස්ථාන මාරු 2021.01.01 දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

i. සංවර්ධන නිලධාරී සේවය     ii. පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය

03. බ.ප. ප්‍රධාන ලේකම්ගේ ඉහත අංක දරණ ලිපියේ 5 වන ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, පහත පරිදි වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| ආයතනය | අයදුම්පත් | උපලේඛනය |
|---|---|---|
| දෙපාර්තමේන්තු ස්ථාන මාරු | CSWP/PTR/FO/11A | CSWP/PTR/FO/12A (AX3 ප්‍රමාණයේ කඩදාසිවල) |
| අමාත්‍යාංශ ස්ථාන මාරු | | |
| ප්‍රධාන ලේකම් කාර්යාලීය ස්ථාන මාරු | CSWP/PTR/FO/11B | CSWP/PTR/FO/12B (AX3 ප්‍රමාණයේ කඩදාසිවල) |
| වත්මන් සේවා ස්ථානයේ වසර 5 ට වැඩි | - | CSWP/PTR/FO/13 (AX3 ප්‍රමාණයේ කඩදාසිවල) |
| ස්ථාන මාරු පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම | CSWP/PTR/FO/14 | - |


| | කාර්යාලය<br>அலுவலகம்<br>Office | පළාත් අධ්‍යක්ෂ<br>மாகாண பணிப்பாளர்<br>Provincial Director | සැලසුම් අංශය<br>திட்டமிடல்<br>Planning Unit | නි.අධ්‍යක්ෂ (පාලන)<br>பிரதிப்பணிப்பாளர் (நிர்வாகம்)<br>Deputy Director (Admin) | ප්‍රධාන ගණකාධිකාරී<br>கணக்காளர்<br>Chief Accountant | පරිපාලන නිලධාරී<br>நிர்வாக அதிகாரி<br>Adm. Officer |
|---|---|---|---|---|---|---|
| T.P | 0112434660 | 0112437154 | 0112478677 | 0112434852 | 0112437155 | 0115337896 |
| Fax | 0112478677 | 0112478667 | 0112478667 | 0112478667 | 0112451066 | 0112478667 |
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | | | |

මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,තැ.පෙ.876,කොළඹ 10. மாளிகாவத்தை செயலகம்,த.பெ.இல.876,கொழும்பு 10. Maligawatta Secretariat Building, P.O. Box 876, Colombo 10.
www.healthdept.wp.gov.lk

04. බ.ප. ප්‍රධාන ලේකම්ගේ ඉහත සඳහන් ලිපියේ 8.1 හා 8.2 යටතේ දක්වා ඇති කාලසටහනට අදාළව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, නියමිත දින නොඉක්මවමින්, එක් නිලධාරියෙකු CSWP/PTR/FO/11A හෝ CSWP/PTR/FO/11B යන අයදුම්පත්වලින් **එක් ස්ථාන මාරු මණ්ඩලයකට පමණක්** අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. මෙම අදාළ උපලේඛන අක්ෂර විශාලත්වය 12 (Font Size) සහ අක්ෂර වර්ගය (Font) – Iskola Pota භාවිතා කර පැතුරුම්පතක් (Microsoft Excel) මගින් නිවැරදිව සම්පූර්ණ කර info@healthdept.wp.gov.lk විද්‍යුත් ලිපිනයට මෘදු පිටපතක්ද, ආයතන ප්‍රධානියා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව දෘඩ පිටපතක් ද මගින් 2020.08.03 දිනට පෙර බ.ප. සෞඛ්‍ය ලේකම් මගින් බ.ප. ප්‍රධන ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා මා වෙත ඉදිරිපත් කළ යුතුය.

05. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතින්හි 200, 201, 202 හා 203 වගන්තිවල සඳහන් විධි විධාන බලපැවැත්වෙනු ඇත.

අත්/කළේ. වෛද්‍ය ධම්මිකා ජයලත්,
බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

හංසනී හෙට්ටිආරච්චි ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන).

o/c

පිටපත : ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත - කා.දැ.ගැ.ස.